## ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීයව වඩා යහපත් ආකාරයෙන් පුරවැසි ප්‍රඥාප්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට

(ආ) දිස්ත්‍රික්කයේ පරිපාලනය හා සංවර්ධන සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධානියා බවට පත්වීමට

(ඇ) දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය සේවයේ ඵලදායිතාවය හා ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා රජයේ ප්‍රතිපත්ති හා පරිපාලන ව්‍යුහයන් වඩා යහපත් ක්‍රමයකට ක්‍රියාත්මක කිරීමට

(ඈ) විනිවිදභාවයෙන් යුත් අපක්ෂපාති හා වගකිවයුතු රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට

(ඉ) කාර්ය මණ්ඩල ධාරිතාවය ශක්තිමත් කිරීමට.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට

(උ) කාර්යක්ෂම හා ඵලදායි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලන ක්‍රමය වැඩිදියුණු කිරීමට

(ඌ) දිස්ත්‍රික්කයේ පොදු ජනයාගේ අවශ්‍යතාවයන් සපුරා ලීම සඳහා කාර්යක්ෂම සේවා බෙදා හැරීමක් සැපයීමට

(එ) රජයේ සේවාවන්හි ඵලදායිතාවය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය සමස්ත සේවාවන්ට හඳුන්වා දීමට

(ඒ) ප්‍රධාන මුල්‍ය දර්ශක මැනීමට

(ඔ) අමාත්‍යාංශ විසින් පවරනු ලබන කාර්යයන් ඉටු කිරීමට

(ඕ) රාජ්‍ය උත්සව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීමට

(ක) දිස්ත්‍රික් මට්ටමින් විදේශ අරමුදල් ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සමාලෝචනය කිරීමට

(ග) අවදානම් කළමණාකරණය හා ආපදාවන්ට මුහුණදීම පිණිස පූර්ව සැලසුම් කටයුතු පිළියෙල කිරීමට

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

-----------------------------------------------------------------------

(අ) මරිටයිම්පත්තු

(ආ) ඔඩ්ඩුසුඩාන්

(ඇ) මන්තායි නැගෙනහිර

(ඈ) තුනුක්කායි

(ඉ) පුදුකුඩියිරුප්පු

(ඊ) වැලිඔය

## 1.3 විගණන විෂය පථය

----------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 පෙබරවාරි 02 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම්

හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම්වලින් ඇති වන බලපෑම හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

**----------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| විශ්‍රාම අධිහාර ලේඛණය | 4:4(II) කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| විවිධ වර්ගයේ විශ්‍රාම වැටුප් ලේඛණය | 4:2(I) කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| උපපත්‍රිකා පොත් ලේඛණය | 5:10 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| පොත් නාමාවලිය | 5:9 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| දුරකථන ලේඛණය | 846(3), 845(1) මුදල් රෙගුලාසිය |

| | |
|---|---|
| පරිපූරක ලේඛණය | 533 මුදල් රෙගුලාසිය |
| සුරක්ෂිතාගාර පොත | 533 මුදල් රෙගුලාසිය |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.2,321,468 ක් වූ ගනුදෙනු 10 ක් මුදල් ලදුපත්, නිලධාරීන්ගේ නිරීක්ෂණ දිනයන්, සහතික කිරීම් හා ලැබූ තැනැත්තාගේ අත්සන් යනාදි සාක්ෂි නොවීම මත සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ඈ) විසර්ජන ගිණුම්**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 255,802,225 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.243,356,416 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 12,445,809ක් හෙවත් සියයට 4.8ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.** | **රු.** | **රු.** | |
| පුනරාවර්තන | 137,007,225 | 125,938,794 | 11,068,431 | 8 |
| මූලධන | 118,795,000 | 117,417,622 | 1,377,378 | 1.1 |
| එකතුව | **255,802,225** | **243,356,416** | **12,445,809** | 4.8 |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 10 ක් හා දෙපාර්තමේන්තු 11 ක් විසින් එකතුව රු.240,924,269 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු. 231,452,662 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනයෙන්

රු.9,471,607 ක් හෝ සියයට 3.9 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

- ඉතිරිවීම් සියයට 5 කට වඩා වැඩියෙන් වූ අවස්ථා 11ක් සඳහා විගණනයට පැහැදිලි කිරීම් දක්වා නොතිබුණි.

**(iii) ආදායම් ගිණුම**

**-----------------**

මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව හිඟ ආදායම් ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(iv) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

**-------------------------------------------------------**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 13,000,000 | 12,997,638 | 5,000,000 | 9,085,823 | 44,000,000 | 33,555,918 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.726,573 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

- 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 14:5 ඡේදයට පටහැනිව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු වෙත රු.1,205,340 ක වර්ෂ දෙකක ණය ලබාදී තිබුණු අතර මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

**-----------------**

අග්‍රිම ලේඛණය සහ අතුරු අග්‍රිම ලේඛණය විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** වර්ෂ 2 සිට වර්ෂ 4 දක්වා කාලයක් පැවැති එකතුව රු.1,307,323 ක්වූ පැමිණිලිකරුවන්ගේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ii)** විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනත් දෙපාර්තමේන්තු සහ ආයතන විසින් ලබා දුන් එකතුව රු.651,083 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර පොදු තැන්පත් ගිණුමේ වසර 02 සිට 04 දක්වා වු කාලයක් රඳවා තබා තිබුණි.

**(iii)**රු.135,000ක් වු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ රු.45,333ක් වු ආනයන බදු (excise duty) අදාල ආදායම් ගිණුම්වලට බැර නොකර වසර 02 සිට 03 දක්වා කාලපරිච්ඡේදයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

## 1.6 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**------------------------------------**

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**---------------------------**

2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

**1.6.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ (ඇ)ඡේදය සහ 2002 සැප්තැම්බර් 12 සහ 2004 පෙබරවාරි 20 දිනැති පිළිවෙලින් අංක 402 හා 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව 2014 දෙසැම්බර් 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත කර නොතිබුණි.

**1.6.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

2006 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(I) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක් පැවැත්විය යුතු වූවත් සමාලෝචිත වර්ෂය තුළදී කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිල වාහන 26 ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබූ නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

**1.8** **අනුකූල නොවීම්**

**-------------------------**

**නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය වු නීතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | - | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | - | පරිසනක, පරිසනක උපාංග හා මෘදුකාංග සඳහා වන වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 245,238 | අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | 298,906,617 | හානි හා පාඩු පිළිබඳ ලේඛණය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 137 | 38,456 | වැය(expenditure head) ශීර්ෂ 252 යටතේ වු වියදම් දිස්ත්‍රික් ලේකම්වරයා වෙනුවට, දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන නිලධාරි විසින් අනුමත කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි756 | - | (i)ග්‍රාම නිලධාරි වසම් 136ක වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. |
| | - | (ii)සමාලෝචිත වර්ෂයේදී මන්තායි නැගෙනහිර ලේකම් කාර්යාලයේ, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී ගබඩා අයිතම 185ක තථ්‍ය භෞතික ශේෂය සත්‍යාපනය කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 2,497,861 41/90 දරන චක්‍රලේඛය | රාජකාරි වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ සෑම මාස 06 කට වරක් ම පරීක්ෂා කර නොතිබුණි. |

(ඇ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

| | | |
|---|---|---|
| 5.4.11 මාර්ගෝපදේශය | - | එකතු කළ අගය මත බදු මුදල් පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හා විගණකාධිපතිට දැනුම්දී නොතිබුණි. |

## 1.9 පාඩු හා හානි

විසර්ජන ගිණුම අනුව සුනාමි ව්‍යසනය හා කළබල පැවැති කාලයේ දි රු.298,906,617ක නැතිවීම් සිදුවූ බව දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

පරිගණක මුද්‍රණ යන්ත්‍ර සඳහා රු.306,000ක වටිනාකම ඇති ටෝනර් කාට්රේජර් (Toner cartridges) 27ක් මිලදී ගෙන තිබුණද තත්ත්ව සහතික,(bar code) සංකේත අංක හා හඳුනා ගැනීමේ සලකුණු නොමැති වීම හේතුවෙන් ඒවායේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 15 | - | 07 |
| (ii) | තෘතියික මට්ටම | 13 | - | 13 | - |
| (iii) | ද්විතියික මට්ටම | 192 | 173 | 19 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 25 | - | 13 |
| | එකතුව | 225 | 213 | 32 | 20 |

පුරප්පාඩු 32ක් පිරවීමට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අතිරික්ත සේවකයින් විසිදෙනා පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.